JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ආදර්ශ ප්‍රශ්න පත්‍රයකි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
## අදියර III විභාගය - 2021 මාර්තු

## (304) සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය
(Corporate & Personal Taxation)

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන : 09

- අයදුම්කරුවන්ට උපදෙස් (අවධානයෙන් කියවිය යුතුය)
  (1) **දී ඇති කාලය** : කියවීම සඳහා - විනාඩි 15 යි.
  උත්තර ලිවීම සඳහා - පැය 03 යි.
  (2) **සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.**
  (3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්**, ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
  (4) ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.
  (5) වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණන යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.
  (6) ලකුණු 100

---

## A කොටස
(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ස්ට්ව් ස්මිත් ඕස්ට්‍රේලියානු පුරවැසියෙකි. ඔහු ශ්‍රී ලංකාවේ පිහිටි ඕස්ට්‍රේලියානු ක්‍රිකට් පුහුණු ආයතනයක ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා ලෙස පත් කරන ලදී.

ඔහු තම රාජකාරි භාර ගැනීම සඳහා 2019 මැයි මස 31 දින ශ්‍රී ලංකාවට පැමිණි අතර, 2019/20 තක්සේරු වර්ෂය තුල ඔහු දින 32 ක නිල නිවාඩුවක් සඳහා ඕස්ට්‍රේලියාවට ගොස් එහි ගත කරන ලදී.

ඔබ විසින් කල යුතු දෑ,

a) 2019/20 වර්ෂය සඳහා ස්මිත් ගේ වාසිකභාවය හඳුනාගන්න. (ලකුණු 03)

b) ඉහත තත්ත්වය මත ස්මිත්ගේ ආදායම ලංකාව තුල බදු වන ආකාරය දක්වන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව ඕනෑම බදු ගෙවන්නෙකුට තමාට එරෙහිව නැගෙන තක්සේරුවකට, අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතියක් පවතී.

**ඔබ විසින් කල යුතු දෑ,**

a) පනත ප්‍රකාරව හඳුනාගත හැකි තක්සේරු වර්ග මොනවාද? (ලකුණු 02)

b) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තක්සේරුවක් නිකුත් කිරීම සඳහා බලය පැවරෙන කාල පරාසය සඳහන් කරන්න. (ලකුණු 01)

c) බදු අභියාචනා කොමිසමට අභියාචනය කල හැකි අවස්ථා සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

JMC Taxation Model Paper-Nuwan Sameera

### 03 වන ප්‍රශ්නය

පැවරුම් මිලකරණය විදේශ ගණුදෙනුවල සාධාරණ මිල අගයන් තීරණය කිරීම සඳහා උපයෝගී වේ. එපමණක් නොව ඇතැම් අවස්ථාවලදී දේශීය ගණුදෙණු සඳහා ද අදාල වේ.

ඔබ විසින් අවශ්‍ය වන්නේ,

a) දේශීය ගනුදෙනු සඳහා පැවරුම් මිලකරණය යොදාගන්නා අවස්ථා තුනක් සඳහන් කරන්න. (ලකුණු 02)

d) පැවරුම් මිලකරණය භාවිතයේදී යොදාගන්නා මිල ක්‍රමයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 02)

e) ව්‍යවසායක් ප්‍රධාන ලිපිගොනුව (master file) පවත්වාගෙන යා යුතු අවස්ථාවන් සඳහන් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 05)

### 04 වන ප්‍රශ්නය

නුවන් මහතා ඉදිකිරීම් සමාගමක කළමනාකරුවෙකි. ඔහුට සිදු වූ වෛද්‍ය ගැටළුවක් සඳහා ඔහුගේ සේවය අගයා ආයතනය වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට අවශ්‍ය මුදල් ලබා දී ඇති අතර එය දීමනා යනුවෙන් සඳහන් කරන ලදී. සහකාර බදු කොමසාරිස් මෙය සේවා නියුක්ත ආදායමේ කොටසක් ලෙස සලකා ඇති අතර නුවන් මහතා එය තමා පෞද්ගලිකව ලද පරිත්‍යාගයක් ලෙස කරුණු ඉදිරිපත් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

ක්‍රිබ් එදිරිව ආදායම් බදු කොමසාරිස් නඩුවේ තීරණ පදනම් කර ගනිමින් ඉහත ලැබීම සේවා නියුක්ත ආදායමේ නකොටසක් ලෙස සැලකිය හැකි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 05)

——— A කොටසෙහි අවසානය ———

## <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

XYZ සමාගමේ 2019/20 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම් බදු වගකීම රු. 1,000,000 කි. සමාගම 2019/2020 වර්ෂයේ පළමු කාර්තුවේ වාරිකය ලෙස 250,000 ගෙවා ඇත.

2019 නොවැම්බර් 15 දින දක්වා ගෙවන ලද රඳවා ගැනීමේ බදු (WHT) රු. 40,000 කි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

a) දෙවන කාර්තුව සඳහා ගෙවීම් කල යුතු දිනය සඳහන් කර ගෙවිය යුතු වාරිකය ගණනය කරන්න.

b) තැනැත්තෙකු ආදායම් බදු ගෙවිය හැකි ආකාර තුනක් (03) සඳහන් කරන්න.

c) පැහැර හරින ලද බදු අය කරගත හැකි ආකාර 02 ක් සඳහන් කරන්න.

d) 2017 අංක 24 දරන පනත අනුව බලයලත් නියෝජිතයෙකු ලෙස කටයුතු කල හැකි පාර්ශව 02 ක් හඳුනා ගන්න. (මුළු ලකුණු 10)

JMC Taxation Model Paper Nuwan Sameera

## 06 වන ප්‍රශ්නය

''සිරිසර'' යනු ඇඳුම් ආනයනය කර විකිණීමේ නිරත හවුල් ව්‍යාපාරයකි. මෙහි හවුල්කරුවන් වන අමල් සහ පියල් ලාභ අලාභ සම සමව බෙදා ගැනීමට එකඟ වූහ.

2020/03/31 න් දිනෙන් අවසන් වර්ෂයට ආදායම් ප්‍රකාශනය පහත පරිදිය.

| | රු. 000' |
|---|---|
| පිරිවැටුම | 15,500 |
| (-) විකුණුම් පිරිවැය | (8,750) |
| දල ලාභය | 6,750 |
| | |
| සේවක වැටුප් | (660) |
| වත්කම් මත ක්ෂය | (250) |
| විදුලි බිල්පත | (60) |
| අමල් ලබා දුන් ණය සඳහා පොලිය | (70) |
| සුදු ද්‍රව්‍ය | (15) |
| පරිත්‍යාග භාණ්ඩ | (10) |
| ශුද්ධ ලාභය | 5,685 |

**පහත අතිරේක තොරතුරු සපයා ඇත.**

(1) අමල්ගේ බිරිඳ වන කමනි මෙම ව්‍යාපාරයේ ප්‍රධාන ගණකාධිකාරිණිය ලෙස සේවය කරන අතර මාසික වැටුප රු. 25,000 කි. ඇයට ගෙවූ 300,000 හා පියල්ට ගෙවූ 1000,000 වැටුප සේවක වැටුප් තුල ඇතුලත්ය.

(2) 2019/20 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු අනුව ප්‍රාග්ධන දීමනාව රු. 100,000 කි.

(3) පරිත්‍යාග තුල ඇත්තේ අවට නිවසකට ලබා දුන් වියලි ආහාර පිරිවැයයි.

**ඔබ විසින් අවශ්‍ය වන්නේ,**

a) බදු අරමුණු සඳහා හවුල් ව්‍යාපාර ආදායම
b) හවුල් ව්‍යාපාරය ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද
c) එක් එක් හවුල්කරුගේ හවුල් ව්‍යාපාර ආදායම් කොටස
d) එක් එක් හවුල්කරුට හිමි රඳවා ගැනීමේ බදු බැර කොටස

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

A. සීමාසහිත NS Technology සමාගම පරිගණක ආනයනය කර විකිණීමේ නිරත වී සිටින අතර මෘදුකාංග නිෂ්පාදනය කර සැපයීමේ කටයුතුවලට යෙදී සිටී. නඩත්තු කටයුතු ද සිදු කරයි.

2020 මාර්තු 31 න් අවසන් කාර්තුවට අදාල පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදී.

JMC Taxation Model Paper-Nuwan Sameera

1. <u>ආදායම (VAT රහිත අගයන්)</u>

| | රු. |
|---|---|
| පරිගණක විකුණුම් | 6,000,000 |
| මෘදුකාංග - විදේශීය ගැණුම්කරුවන්ට | 4,000,000 |
| - දේශීය ගැණුම්කරුවන්ට | 8,000,000 |
| හඳුනාගත් ලියාපදිංචි ගැණුම්කරුවෙකුට - (RIP) සපයන ලද නඩත්තු සේවාව. | 1,000,000 |

2. <u>සමාගම ගෙවන ලද යෙදවුම් බදු</u>

| | රු. |
|---|---|
| පරිගණක එකලස් කිරීම මත | 50,000 |
| මෘදුකාංග නිෂ්පාදන අමුද්‍රව්‍ය මත | 1,000,000 |
| ගොඩනැගිලි කුලී මත (එකම ගොඩනැගිල්ල සියළුම කාර්යයන් සඳහා යොදා ගනී) | 50,000 |
| ආයතන නිෂ්පාදන බෙදාහැරීමට රථයක් මිලදී ගැනීම මත | 75,000 |

3. පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන ආ යෙදවුම් බද්ද රු. 25,000.

4. SVAT මත විකුණුම් වෙනුවෙන් 80% කට අදාලව පමණක් SVAT බැර වවුචර් පත් සමාගම විසින් එකතු කරගෙන ඇත.

**ඔබ විසින්,**

a) 2020 මාර්තු 31 අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු (වැඩිපුර ගෙවූ) එකතු කල අගය මත බද්ද ගණනය කරන්න.

b) ගෙවීම් කල යුතු දිනය හා අදාල කාර්තුවට බදු වාර්තාව ඉදිරිපත් කල යුතු දිනයන් සඳහන් කරන්න.

(මුළු ලකුණු 07)

B. මුද්දර ගාස්තු ගෙවීම, ප්‍රධාන ආකාරයට මධ්‍යම රජයට හා පලාත් පාලන ආයතන වලට වේ.

**ඔබ විසින්,**

(i) මධ්‍යම රජයට ගෙවිය යුතු මුද්දර ගාස්තු සඳහා උදාහරණ දෙකක් දක්වන්න.

(ii) පෙරේරා මහතා විසින් තම නිවස තෑගි ඔප්පුවකින් තම පුතාට පවරන ලදී. නිවසේ වටිනාකම රු. 1,000,000 ලෙස තක්සේරු කර ඇත. මෙම නිවස දකුණු පලාතේ පිහිටා ඇත.

(a) ගෙවිය යුතු මුද්දර ගාස්තුව ගණනය කරන්න.

(b) ගෙවිය යුතු අධිකාරී ආයතනය සඳහන් කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

JMC Taxation Model Paper-Nuwan Sameera

## C කොටස

(මුළු ලකුණු 50)
අනිවාර්යය ප්‍රශ්න 02 කි.

### 08 වන ප්‍රශ්නය

VGN පුද්ගලික සමාගම 2007/07 දරණ සමාගම පනත යටතේ 2010 වර්ෂයේ සංස්ථාපිත කරන ලද අතර දේශීය හා විදේශීය වෙළඳපොල වෙත විදුලි උපකරණ නිෂ්පාදනය කර බෙදා හරී.

පහත තොරතුරු ආයතනයේ 2020/03/31 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් උපුටා ගන්නා ලදී.

| | රු. 000' | |
|---|---|---|
| විකුණුම් - දේශීය | | 138,150 |
| - විදේශීය | | 646,450 |
| | | 784,600 |
| (-) විකුණුම් පිරිවැය | | (630,122) |
| දල ලාභය | | 154,478 |
| (+) වෙනත් ආදායම් | | 5,920 |
| | | 160,398 |
| (-) වියදම් | | |
| පරිපාලන | (34,650) | |
| විකුණුම් හා බෙදා හැරීම | (13,423) | |
| මූල්‍ය පිරිවැය | (9,685) | (57,938) |
| බදු පෙර ශුද්ධ ලාභය | | 102,460 |

**අමතර තොරතුරු:**

**1. වෙනත් ආදායම්**

වෙනත් ආදායම් පහත දෑ වලින් සමන්විතය.

| | රු.000' |
|---|---|
| වෙනත් ආයතන වලින් ලද ශුද්ධ ලාභාංශ | 1,300 |
| ස්ථාවර තැන්පතු මත ශුද්ධ පොලී ආදායම | 570 |
| ජෙනරේටර් විකුණුම් මත ලාභය | 220 |
| ඉඩම් විකුණුම් මත ලාභය | 3,830 |
| | 5,920 |

2.

- **පරිපාලන වියදම් තුල පහත දෑ ඇතුලත්ය.**

2019 දෙසැම්බර් මාසය තුල දරන ලද පර්යේෂණ හා සංවර්ධන වියදම රු. 6,652,000 කි. ඉහත පිරිවැය තුල රු. 1,400,000 වටිනා විද්‍යාගාර උපකරණ මිලදී ගැනීමේදී ඇතුලත් වේ. විද්‍යාගාර උපකරණ පිරිවැය හැර අනෙකුත් පර්යේෂණ වියදම් නිවරදිව පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කර ඇත.

JMC Taxation Model Paper-Nuwan Sameera

- රු. 236,000 දඩ මුදලක් සේවක අර්ථ සාධක, අරමුදලට ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා ඇත.

- ගිණුම්කරණ ක්ෂය වියදම් රු. 14,435,000.

3. විකුණුම් හා බෙදාහැරීම් වියදම් තුල පහත දෑ අන්තර්ගතය.

- විනෝදාංශ වියදම් ප්‍රතිපූර්ණය 632,000
- රු. 850,000 වටිනා කසල පුරවන බාල්දි 200 ක් නගර සභාව සඳහා පරිත්‍යාග කරන ලදී.
- රෝගී හා අවශ්‍යතා සහිත පුද්ගලයන් වාසය කරන අනුමත පුණ්‍ය ආයතනයක් සඳහා රු.100,000 පරිත්‍යාග කරන ලදී.
- විකුණන ලද ඉඩම මිලදී ගත්තෙකු සෙවීම සඳහා දරන ලද ප්‍රචාරණ ගාස්තු වියදම රු. 63,000.

4. **දේපල, පිරියත, උපකරණ සටහන.**

- 2019/20 තක්සේරු වර්ෂයේ මිලදී ගැනීම්.

| | රු.000' |
|---|---|
| විද්‍යාගාර උපකරණ | 1,400 |
| නව ජෙනරේටරය | 5,400 |
| සේවක ප්‍රවාහන මිනි බස් රථය | 6,340 |
| කළමනාකරුගේ මෝටර් රථය | 4,200 |

- 2019 මැයි මස ජෙනරේටරය රු. 1,500,000 කට විකුණන ලද අතර, එය 2017/18 තක්සේරු වර්ෂයේ රු. 4,800,000 කට මිලදී ගෙන ඇත.

- වර්ෂය තුල වෙනත් බැහැර කරන ලද වත්කම් නොමැති අතර අනෙකුත් සියළුම වත්කම් සඳහා 2019, අප්‍රේල් 01 දින වන විට සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධන දීමනාව ලබාගෙන ඇත.

5. 2019 අගෝස්තු 16 වන දින රු. 13,500,000 ප්‍රතිශ්ඨාවකට ඉඩමක් විකුණන ලද අතර මෙම ඉඩම 2000 වර්ෂයේ රු. 9,690,000 පිරිවැයට මිලදී ගෙන තිබේ. 2017/09/30 දිනට වෙළඳපොල වටිනාකම රු. 12,780,000 කි.

6. සියළුම මූල්‍ය පිරිවැය ව්‍යාපාර ආදායම් ඉපයීම සඳහා සෘජුව දායක වන අතර, ශේෂ පත්‍ර දිනට ආයතනයේ හිමිකම හා ණය වගකීම් පහත පරිදිය.

| | රු.000' | |
|---|---|---|
| **හිමිකම** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 3,000,000 | |
| රඳවාගත් ලාභ | 1,200,000 | |
| ප්‍රත්‍යාගණන සංචිත | 500,000 | |
| | 4,700,000 | |
| **ණය ප්‍රාග්ධනය** | | |
| ණයකර | | 4,000,000 |
| බැංකු ණය | | 13,700,000 |
| කල් බදු ණයහිමි | | 2,300,000 |
| | | 20,000,000 |

JMC Taxation Model Paper - Nuwan Sameera

7. අනෙකුත් සියළුම වියදම් බදු අරමුණ සඳහා අඩු කිරීමට ඉඩ දේ.

8. 2018/19 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ බදු සඳහා ව්‍යාපාර අලාභය රු. 250,000.

9. 2019/20 තක්සේරු වර්ෂය සඳහා ගෙවන ලද බදු වාරික වටිනාකම රු. 5,000,000 කි.

**2019/20 තක්සේරු වර්ෂය සඳහා VGN සමාගමේ,**

a) බදුවන ආදායම ගණනය කරන්න.
b) දල ආදායම් බද්ද ගණනය කරන්න.
c) ඉතිරි ගෙවිය යුතු බද්ද ගණනය කරන්න.
d) විකුණන ලද ඉඩම මත ප්‍රාග්ධන ලාභ බදු ගෙවිය යුතු අවසාන දවස සඳහන් කරන්න.

(මුළු ලකුණු 25)

**09 වන ප්‍රශ්නය**

වරලත් ගණකාධිකාරීවරයෙකු වන කවිජ ගමගේ මහතා ප්‍රධාන පෙලේ ව්‍යාපාරික ආයතනයක මූල්‍ය කළමනාකරු ලෙස සේවය කරයි. ඔහු සමාගමට ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශනයක්ද ලබා දී ඇත.

2019/20 තක්සේරු වර්ෂය (ඉදිරියට වර්ෂය ලෙස හැඳින්වේ) තුල කවිජ මහතාගේ ආදායම් සම්බන්ධ පහත තොරතුරු ලබා දී ඇත.

1. සේවා නියුක්ති ආදායම්.
   - දළ වැටුප - 250,000 (මසකට)
   - ඔහුගේ පුද්ගලික රක්ෂණ වාරිකය රු. 10,000 (මාසිකව) ආයතනයේ විසින් ගෙවයි.
   - සමාගම සතු නවීන පන්නයේ මෝටර් රථයක් (2,000cc) රියදුරු සමඟ පුද්ගලික භාවිතයට ලබා දී ඇත.
   - සේවා යෝජකයා විසින් මසකට රු. 30,000 කුලියක් ගෙවා ලබාගත් නිවස කවිජ මහතාගේ භාවිතයට ලබා දී ඇත.
   - කවිජ මහතා වර්ෂය තුල තම පුතුගේ විශේෂ උපාධි උත්සාහය සඳහා (සහභාගී වූ අතර එහි ගමන් පිරිවැය 250,000 විය. ඉන් 50% ආයතනය විසින් ප්‍රතිපූර්ණය කර ඇත.
   - ප්‍රතිපූර්ණය කරන ලද දුරකථන බිල් වටිනාකම රු. 100,000.
   - සේවක අර්ථ සාධක සහා සේවක භාරකාර අරමුදලට සේවායෝජක දායකය පිළිවෙලින් 12% හා 3%.
   - වෛද්‍ය බිල් වියදම් ප්‍රතිපූර්ණය රු. 500,000. සමාගම සියළුම සේවකයන්ට වෛද්‍ය බිල්පත් සම්බන්ධව සමාන ප්‍රතිපත්තියක් අනුගමනය කරයි.

2. මීට අමතරව කවිජ ව්‍යාපාර උපදේශන ව්‍යාපාරයක් ද (තනි පුද්ගල) පවත්වාගෙන යන අතර පහත විදේශ ව්‍යාපාරිකයන්ට වර්ෂය තුල උපදේශන සේවා සපයන ආදායම් උපයා ඇත. (මෙය විදේශ ව්‍යාපාර මුදලින් උපයා ඇත)

| | |
|---|---|
| සිංගප්පූර් සමාගමකට | රු. 16,000,000 |
| මැලේසියා සමාගමකට | රු. 4,000,000 |
| | රු. 20,000,000 |

3. කවිජ මහතාට අයත් නිවසක්, ඔහු විසින් වෙනත් ආයතනයක ගබඩා පහසුකම් පවත්වාගෙන යාම සඳහා ලබා දී ඇති අතර මාසික කුලිය 50,000. එහි වරිපනම් තක්සේරුව රු. 200,000. වරිපනම් 30% බැගින් ගෙවන අතර ගිවිසුම පරිදි වරිපනම් ගෙවිය යුත්තේ අදාල කුලියට ගත් ආයතනය වේ. මින් නිසි පරිදි රඳවා ගැනීමේ බදු අඩු කරගෙන ඇත.



JMC Taxation Model Paper-Nuwan Sameera

4. ස්ථාවර තැන්පතුවක් මත ලද පොලිය රු. 76,000 කි. (රඳවා ගැනීමේ බදු අඩු කල පසු)

5. තවද කවිජ මහතාට ලැයිස්තුගත සමාගමක කොටස් ආයෝජනයක් ද පවතින අතර ඉන් ලද ශුද්ධ ලාභාංශ ආදායම රු. 50,000. තවද වර්ෂය තුල කොටස් යම් ප්‍රමාණයන් විකුණන ලද අතර උපලබ්ධි ලාභය රු. 750,0000 කි.

6. වර්ෂය තුල ස්වයං තක්සේරුව මත රු. 130,000 ආදායම් බද්දක් ගෙවා ඇත. කවිජ මහතාගේ 2019/20 තක්සේරු වර්ෂය සඳහා කවිජ මහතාගේ පහත දෑ ගණනය කරන්න.

(a) බදු අය කල හැකි ආදායම
(b) ගෙවිය යුතු දල ආදායම් බද්ද
(c) ගෙවිය යුතු ඉතිරි බද්ද / වැඩිපුර ගෙවූ බද්ද
(d) ගෙවිය යුතු ඉතිරි බද්දක් වේ නම් ගෙවීම් කල හැකි අවසාන දිනය

(ලකුණු 25)

C කොටසෙහි අවසානය

JMC Taxation Model Paper-Nuwan Sameera